# <u>මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය - 2023/2024</u>

2023/2024 ප්‍රවේශ වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්වය සඳහා හිමිකම් ලබා ඇති සිසුන්ගේ බැංකු ගිණුම් පිළිබඳ විස්තර **www.mahapola.lk** වෙබ් අඩවිය වෙත පිවිස පහත සඳහන් සබැඳිය භාවිතා කර **https://www.mahapola.lk/BankApp2024/** ලබා දිය යුතුය.

ඉහත online මගින් මහපොළ අරමුදල වෙත යොමු කරන ලද ආකෘතිපත්‍රයේ භාගත කරන ලද පිටපතක් (hard copy) ශිෂ්‍යත්වලාභියාගේ අත්සන යොදා පෞද්ගලික බැංකු ගිණුමට අදාල පාස්පොතෙහි **<u>සහතික කරන ලද පැහැදිලි පිටපතක්</u>** සමඟ 2025.07.04 දිනට පෙර පීඨයේ පීඨාධිපති කාර්යාලය වෙත බාර දිය යුතුය. ( පීඨ කාර්යාලය වෙත බාර දීමට ප්‍රථම එහි පිටපතක් ශිෂ්‍යත්වලාභියා තබා ගත යුතුය.)

**සම සෞඛ්‍ය විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ විද්‍යා පීඨවල මේ සඳහා හිමිකම් ලබා ඇති සිසුන් අදාල ලියකියවිලි පීඨයට පැමිණෙන දින තම පීඨ කාර්යාලය වෙත බාර දිය යුතුය.**

ශිෂ්‍යත්ව මුදල් බැර කිරීම සඳහා **මහජන බැංකුව හෝ ලංකා බැංකුවේ ගිණුමක්** පමණක් විය යුතු අතර බද්ධ ගිණුම් අංක ලබාදිය නොහැකි බව හා ලබා දෙන ගිණුම් අංක පසුව වෙනස් නොකරන ලෙසත් එවැනි ශිෂ්‍යත්වලාභීන්ගේ වාරික මුදල් ගෙවීම අත්හිටුවීමට සිදුවන බව ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල දන්වා ඇත.

**මහපොළ ශිෂ්‍යත්ව සම්බන්ධ අභියාචනා 2025.06.15 සිට මාස 03ක් ඇතුළත සෘජුවම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු බවද දන්වා සිටිමි.**

සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය කටයුතු.

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

2025.07.01

පිටපත් - 1.උපකුලපති.
2.පීඨාධිපති - වෛද්‍ය/ඉංජිනේරු/කෘෂිකර්ම/විද්‍යා/කළමනාකරණ හා මූල්‍ය/ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා/ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ/ සම සෞඛ්‍ය විද්‍යා/ තාක්ෂණ පීඨය
3.ප්‍රධාන ශිෂ්‍ය උපදේශක
4.වැඩ බලන ලේඛකාධිකාරී